# සතර කෝරළයේ සාහිත්‍ය පසුබිම

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ (විද්‍යාලංකාර මණ්ඩපයේ)
(ඇම්.ඒ.) ශාස්ත්‍රපති උපාධිය (සිංහල) සඳහා
නියමිත පරිදි ඉදිරිපත් කරන ශාස්ත්‍රීය නිබන්ධනය.

Thesis submitted to the Vidyalankara Campus
of the University of Sri Lanka, in partial
fulfilment for the Degree of Master of Arts
(Sinhalese) - 1977

ප්‍රවේශ අංකය 33
වර්ග අංකය

ජී.ආර්.ගුණවර්ධන බණ්ඩා

# හැඳින්වීම

මාගේ ජන්ම භූමිය වූ සතර කෝරළය ක්‍රිස්තු වර්ෂය ආරම්භ වන්නටත් පෙර සිට නූතන අවධිය තෙක් ලංකාවේ පොදු ඉතිහාසය හා බැඳී පවත්නා ප්‍රදේශයකි. එහෙත් පොදු ඉතිහාසයෙන් වෙන් ව කැපී පෙනෙන සේ මෙම පෙදෙසේ සැඟවුණු අවුරුදු දහස් ගණනක ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක තොරතුරු අළලා පළමුවෙන් ඉංග්‍රීසියෙන් කෘතියක් (1892) සම්පාදනය කළේ මෙරටේ කලක් පුරාවිද්‍යා අධිකාරි ව සිටි එච්.සී.පී.බෙල් මහත්මායි. එහෙත් ඉන් පසු ව මහාචාර්ය පරණවිතාන, ආචාර්ය ශොඩකුඹුරේ වැනි කීර්තිමත් විද්වතුන්ගේ පර්යේෂණවලින් හෙළි වූ අලුත් තොරතුරු නිසා සංශෝධිත මේ පෙදෙසේ ඓතිහාසිය, පුරාවිද්‍යාත්මක තොරතුරුත්, සාහිත්‍ය පසුබිමත්, මැනවින් ඉස්මතු වන සේ පර්යේෂණාත්මක ශාස්ත්‍රීය කෘතියක් මෙවකට නො ලියැවී ඇති හෙයින් එවැනි ශාස්ත්‍රීය සංග්‍රහයකින් සේවය කිරීමට මා තුළ පැවැති ආශාවත් මුදුන්පත් කර ගනු සඳහා ගත් උත්සාහයක ප්‍රතිඵලයකි මේ.

කිසියම් සීමිත පෙදෙසක අවුරුදු දහස් ගණනක් පිස්සේ වැසී තිබූ පෞරාණික තත්වයන් අනාවරණය කර ගැනීමට බෙහෙවින් ම උපස්ථම්භක වනුයේ පැරණි නටබුන්, සාහිත්‍ය මූලාශ්‍ර, ප්‍රදේශවාසීන් අතර පවතින ජනප්‍රවාද හා ජනකවිය. මේවා වහල් කරගෙන සතර කෝරළයේ ඓතිහාසික හා සාහිත්‍ය පසුබිම පිළිබඳ ගවේෂණය කරන ආකාරය ගැනත් ශාස්ත්‍රීය කෘතියක් සම්පාදනය කරන ආකාරය පිළිබඳවත් වටිනා උපදෙස් දෙමින් මඟ පෙන්වූයේ මා දයාබර ගුරුදේවයාණන් වූ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ විද්‍යාලංකාර මණ්ඩපයේ සහාය මහාචාර්ය ආචාර්ය නන්දසේන මුදියන්සේ මහත්මායි. ඒ හැර මෙම පෙදෙසේ ඓතිහාසික හා සාහිත්‍ය ආදි සංස්කෘතික තොරතුරු ගැන නිතර සෙවිල්ලෙන් සිටින හා ඒ පිළිබඳ ඉමහත් උනන්දුවක් දක්වන දැදිගම රාජ්‍ය සභා නියෝජිත ගරු අධ්‍යාපන අමාත්‍ය නිශ්ශංක විජේරත්න මැතිතුමාත්, අරනායක රාජ්‍ය සභා නියෝජිත අධිනීතිඥ වසන්ත උදයරත්න මැතිතුමාත්, මාවනැල්ල මයුරපාද මහා විද්‍යාලයේ ආචාර්ය වූත්, ත්‍රිපිටක පරිවර්තක මණ්ඩලයේ සාමාජික වූත් පූජ්‍ය පණ්ඩිත කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේත්, ගල්අතර මහා විද්‍යාලයේ විදුහල්පති ව සිට විශ්‍රාම ලත් ජී.එස්.හෙට්ටිආරච්චි මහත්මාත්, කෑගල්ල ගේ දියාපති ව සිටි කපිල පතිරණ විමලධර්ම මහත්මාත්, සතර කෝරළයේ සැඟවුණු ඓතිහාසිය හා සාහිත්‍ය තොරතුරු සොයා මේ පෙදෙසේ සාහිත්‍ය කලා උන්නතිය උදෙසා කටයුතු කිරීමට යම් යම් ඉඩ ප්‍රස්ථා සලසා දීමෙන් හා අවශ්‍ය දුර්ලභ පොත්පත් හා තොරතුරු සපයා දීමෙන් බෙහෙවින් අනුග්‍රහ කළ බව මෙහි ලා ස්තූතිපූර්වක ව සඳහන් කරමි.

ජී.ආර්.ගුණවර්ධන බණ්ඩා

කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
1982-4--6
පුස්තකාලය